ආචාර්ය
සුනිල් විජේසිරිවර්ධන



## පුරාකෘත පිටස්තරයා 4



අර්ලොව් විසින්ම කළ සිත්තමක්



නීල වෘෂභයා සහ අනස්තාසියා අසුරංගනාව (මේ පින්තාරුවේ යුරෝපා සහ වෘෂභයා ගැන ග්‍රීක පුරාණෝක්තිය තදින් මතක් කරනවා)

# නව වන ස්ථරයේ සිට පොළොවට බසින දනීලොව්

මොස්කව් හි පළවන කීර්තිමත් නෝවයි මීර් සඟරාව විසින් (1925 මුල මේක ආරම්භ කළේ බොල්ෂෙවික් පක්ෂයේ ප්‍රමුඛ අධ්‍යාපනඥයා සහ සාහිත්‍යවේදියෙක් වූ ලුනචාර්ස්කි) 1980 වසර පුරා වාරිකව ජනගත කොට තිබුණු විලදිමීර් අර්ලොව් ගේ Altist Danilov (දනීලොව් නමැති වියෝලා වාදකයා) නම් කෘතිය මම මුල් වරට කියෙව්වේ 1981 මාර්තු මාසයේ එක්තරා දිනකින් පසුව බව නිසැකයි. (මගේ ආචාර්ය උපාධි පර්යේෂණ කෘතියේ කටයුතු අවසන් කොට එය නිල විද්වත් සමීක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කරන්නට ඇත්තේ මේ මාර්තුවේ යම් දිනක වෙන්න ඕන. ඉන්පසු එළැඹෙන්නේ ප්‍රතිපල අපේක්ෂාවෙන් පසුවන සමය. පර්යේෂණ නිබන්ධනය විද්වත් සමීක්ෂණ දෙකක් හරහා යමින් විමසුමට භාජනය වන අතර අවසාන තීරණය ලැබෙන්නට මාස 06කට නොඅඩු කාලයක් ගත වෙනවා. ජයග්‍රහණය පිළිබඳ තොරතුර 'උත්සවශ්‍රීයෙන් ' මා අත පත්වුනේ 1981 සැප්තැම්බර් මාසයේ)

අපේ විද්‍යාගාරයක සේවය කළ ගාල්යා දුලබ සාහිත්‍ය පොත් දඩයම් කිරීමේ දුෂ්කර කාර්යය සම්බන්ධයෙන් පුදුමාකාර වැඩකාරියක් බව කියන්න ඕන. ; තවම පොතක් ලෙස මුද්‍රණයෙන් පළ නොවී තිබුණු 'දනිලොව් කතන්දරය' රැගත් සඟරා ගොන්න 1981 මාර්තු හෝ අප්‍රේල් දිනයක මා අත තියලා "මෙන්න, දැන්වත් හරියකට නිදා ගනින්" දයාබරව ඈ කිව්වා. ඇය එහෙම කිව්වට එදා රාත්‍රියේ සිට මගේ නින්ද දින ගණනාවක් ඇත්තටම අවුල් වුණා. ඒ දනිලොව් නමැති අපූරු අසුරයා මට වැහෙන්නට පටන් ගත් හන්දයි. මින් වසර දෙක තුනකට ඉහත ලෙර්මෙන්තොව් ගේ විශාල කාව්‍යය 'Demon ' මා කියවා තිබුණා. අසුර ආකර්ශනය නිසාම තෝමස් මාන් ගේ විශිෂ්ටම කෘතිය ලෙස සැලකෙන DR' Faustus නවකතාව (රුසියන් පරිවර්තනය) ත් ඔය කාලෙම වගෙයි කියෙව්වෙ. ගාල්යා ට පින් සිදුවන්නට මිඛයිල් බුල්ගාකොව් ගෙ 'මාස්ටර් සහ මාර්ගරිටා' නවකතාවේ photo copy පිටපතක් ද කලකට පෙර මා අතට ආවා. ඉතින් විධිමත් සාහිත්‍ය විචාර පුහුණුවක් මේ වන විට මා සතු නොවුනත් (දැන් ඒ පුහුණුව ඇතැයි මින් නොකිය වේ) දනිලොව් ගැන එක දෙයක් අනායාසයෙන් මට පැහැදිලි වුණා. ඒ එයාට ලෙර්මෙන්තොව් ගේ Demon කාව්‍යයේ අසුරයාටත් , ජර්මන් සාහිත්‍යයේ ඈතක සිට එන ෆෞස්ටියානු පුරාණෝක්තිය (යක්ෂයාට ආත්මය විකිණූ විත්තිය) තදින් ස්පර්ශ කරන මාන් ගෙ නවකතාවේ කේන්ද්‍රීය චරිතයටත් ළඟ නෑ කමක් තියෙනවා කියන එක. (සමහර විට නතාලියා දිමිත්‍රියෙව්නා ගේ සාහිත්‍ය පන්තියේ ( 1977-78) සාකච්චා, සාහිත්‍ය නිර්මාණ දිහා බලන ඇහැ වඩා තියුණු කරන්න ඇති, විචාරශීලී කරන්න ඇති. ඒත් මගේ මිතුරනි, මම සෝවියට් දේශයට ගියේ සාහිත්‍යය හෝ සංගීතය ඉගෙන ගන්න නෙමෙයි; වෙන වැඩකට. සාහිත්‍යය කියවද්දී "වැඩක් කරනවා හදාරනවා" කියන සංකල්ප කිසිදාක මගෙ ඔළුවට නොපැමිණි බව සහතික කොට කියන්න ඕන. ආසාවට කියෙව්වා පමණයි; ශාක ප්‍රවේණි විද්‍යාවට සහ කෘෂිකර්මයට අදාළව කියවපු සෑම ලිපියක් පොතක් ගැනම විධිමත් සටහන් තබල ඒවා catalog කළත් කියවපු සාහිත්‍ය කෘතීන් සහ අනෙක් ආකාරයේ පොත්පත් ගැන කිසිම දාක කිසිම සටහනක් තිබ්බෙ නැහැ. පසු කාලෙක ඒ ගැන කණගාටුවක් වගේ දෙයක් ඇවිත් ගියත් ඇත්ත ඒකයි) මාන් ගෙ නවකතාවේ කේන්ද්‍රය හොබවන චරිතය අද්‍රියන් ලෙවෙර්කුන් හට දනීලොව් දක්වන එක්තරා විදිහක නෑ කම හොඳටම පැහැදිලියි. ඔහු සංගීතඥයෙක් ; කතාව කියන්නේ ඔහුගේ සමීපතර මිත්‍රයෙක් වූ සෙයිට්බ්ලොම් ය. අර්ලොව්ගේ නවකතාවේ කේන්ද්‍රීය චරිතය ත් සංගීතඥයෙක් ; කතාව කියන්නේ අර වාගේම 'හොඳින් දන්නා ' මිතුරෙ ක් .

plot එකේ එහෙම යම් යම් සමාන්තර කම් පෙනුනට, දනිලොව් එක්තරා අර්ථයකින් , ලෙවෙර්කුන් ගෙ ප්‍රතිපක්ෂය වගෙයි ; ලෙවෙර්කුන් ගෙ ප්‍රතිභාව පස්සෙ බලගතු 'යක්ෂ' හෙවනැල්ලක් - බලපෑමක් තියෙනවා ; එතන මනුෂ්‍යත්වයට එරෙහි මුලක් තියෙනවා වගෙ. ඔහු මනුෂ්‍ය ආදරය ප්‍රතික්ෂේප කරන්නෙ නිර්මාණක-



විලදිමීර් අර්ලොව්

රණය තුළ ඉහළට නැගීමේ ආශාවෙන් ; ඔහුගේ උන්මත්තක මනස මේ යක්ෂ අනුරාගයේ හේතුව වගේම ප්‍රතිපලයකුත් වෙනවා.

දනීලොව් වියෝලාව ඉගෙන ගන්නෙ ඔහු සතු demonic / දිව්‍යමය තාක්ෂනය සහ බලය පිළිකෙව් කරමින් ; හුදු මනුෂ්‍ය ධෛර්යයෙන් , මනුෂ්‍ය වීර්යයෙන් . එහි ප්‍රතිපලය වශයෙන් ඔහුගේ අධ්‍යාත්මික සැකැස්ම වඩ වඩා මානුෂිකරණය වෙනවා. ඒ සමග ඔහු සාමාන්‍ය මිනිස් දුවකට පෙම් බඳිනවා.

ගැඹුරින් බලන කොට අපට නොවැරදී පෙනෙනවා ඔහු ගේ ආත්මය ලෙර්මෙන්තොව් ගෙ ඈපදබ - සුරලොවට එරෙහි වූ කැරළිකාර අසුර ආත්මය - සමග සමාන්තර ලක්ෂණ පෙන්වන ආකාරයක්; දනීලොව් නවකතාවේ cosmology එක පෙන්වන වැදගත් කරුණක් තියෙනවා ; දනීලොව් ගෙ සම්භව ස්ථානය තියෙන්නෙ පොළොවට සාපේක්ෂව පහළ නෙමෙයි හුඟක් ඉහළ ස්ථානයක බව. ඒ ලෝකයෙත් ස්ථර නමයක් තියෙනවා; වරක් ඔහු පොළොවට බහින්නෙ අකුණු සමග අර 9වන ස්ථරයේ ඉඳලා .

දනීලොව් අසුර ලෝකේදි අසුරාධිකාරියෙන් මර්දනයට ලක් වෙන්න හේතු දෙකක් අපට පෙනෙනවා ; කොහොමටත් ඔහු අසුරයෙක් වන්නෙ පිය පාර්ශවයෙන් පමණයි, මව මිනිස් දුවක් ; පූර්ණ අසුරයෙක් වන ඔහුගෙ පියා රුසියාවේ යරස්ලාව්සකයි ප්‍රදේශයේ දනිලවා නම් කාන්තාවක් සමග පැවැත්වූ 'අනියම් ' සම්බන්ධය යි ඔහුගෙ උපතට හේතුව. නමුත් ප්‍රධාන කාරණය වෙන්නෙ ඔහු සාමාන්‍ය අසුරයෙක් විදිහට වැඩ නොකරන කැරළිකාර තත්ත්වයයි; ඉතින් ඔහු පූර්ණ අසුරයෙක් ගේ තත්ත්වයේ සිට 'ගිව්සුම් ප්‍රකාර' අසුරයෙක් බවට පහළට දමනු ලබනවා . ඔහුට පියා ඇතුළු පූර්ණ අසුරයින් මුණගැසීම තහනම් කෙරනවා . ඒ විතරක් නෙමෙයි දැඩි දඬුවමක් වශයෙන් ඔහුව ' අති-නින්දාසහගත රැකියාවකට ' පොළොවට පිටුවහල් කරනු ලබනවා . ඒක තමයි මොස්කව් නගරයේ අස්තාන්කිනා ප්‍රදේශයේ (ප්‍රකට අස්තාන්කිනා tv tower එක තියෙන පැත්තෙ) මිනිසුන්ට කෙණෙහිලි කම් කිරීමේ ව්‍යපෘති වල යොදවලා ඉන්න පහත් සත්ව කොටස් - ගෙවලයින් , පිශාචයින් , කුම්භාණ්ඩයින් - අධීක්ෂණය කිරීමේ රාජකාරිය හෙවත් අසුරකාරිය.

කතන්දර රැහැන් පටවල් ගණනාවක් අපූරු විදිහට ඔය මැද්දෙ එතෙනවා ; ඉතාලියේ මහා ඇල්බානි විසින්ම නිර්මාණය කරන ලද වියෝලාවක් දනීලොව් සතුව තිබීම සහ ඒක නැතිවීමේ , විනාශවීමේ සහ නැවත මතුවීමේ කතාව ; දනීලොව් අනස්තාසියා නම් අසුරඟන ට පෙර බැඳි පෙම, අසුරයින්ගේ අනුරාගී ජවනිකා නිසා පොළෝ වාසීන්ට ස්වභාවික උපද්‍රව හා ව්‍යසනවලට මුහුණ දෙන්නට සිදුවීම, දනීලොව් ගේ ප්‍රේමයට බඳුන් වූ නතාෂා ට හිරිහැර කරන්නට අසුරයෙක් මානන අල්ල පනල්ලේ කර්මදොන් නමැති ඔහුගෙ පරණ අසුර හිතවතා සමග ඇතිවන ද්වන්ධව සටන, කර්මදොන් නීල වෘෂභයෙක් බවට පරිවර්තනය වීමෙන් සිදුවන සන්තෑසිය ..

කොහොම කොහොම හරි අන්තිමට අසුරලොව උපරිමාධිකරණය කරුණු විමසලා දනීලොව් වඩ වඩා මනුෂ්‍යයෙක් වීම භයානක පූර්වාදර්ශයක් බැවින් ඔහුගෙන් දනීලොව් යන ආත්මසාරය අයින් කොට මකා දැමිය යුතු යයි තීරණය කරනවා , එහෙත් තව ඉන්ද්‍රජාලික සිද්ධියක් වෙලා ඒ තීරණය වෙනස් වෙනවා. ඔහු පොළොවට යැවෙනවා ඉරණමට අමුතු දඬුවමක් ගැටගහලා. ඒක තමයි සංගීතයේ ඔහු ජයග්‍රහණ ලබමින් උඩට යන්න යන්න, මනුෂ්‍යයෙක් ලෙස ඔහුගේ සංවේදීතාව තීව්‍ර වීම; අන්න ඒනිසා මිනිස් ලෝකයේ ඇතිවන සමාජ ගැටුම් ව්‍යසන, මිනිසාට වන ස්වභාවික විපත් යනාදිය නිසා ඔහුට හදවතින් වඩ වඩා විඳවන්නට සිදුවීම; නමුත් ඔහු මනුෂ්‍ය භාවය පිළිගෙන, සිය ආදරය වන නතාෂා ළඟට යන්නම යනවා. ඔහුගේ නැතිවුණු වියෝලාව ආපසු ලැබෙන අරුංචියකින් කතන්දරේ අවසානයට එනවා .

i) මනුෂ්‍යයෙක් නොවන දනීලොව් නමැති කැරළිකාර අසුරයා මොස්කව් නගරයේ මනුෂ්‍යයින් කියන අයට සාපේක්ෂව වඩා ඉහළ මට්ටමේ මනුෂ්‍යත්වයක් (සදාචාර මට්ටමක්) අත්පත් කරගැනීම කරා ගිය ගමනත්

ii) ඔහු මිනිස් දියණිය නතාෂා ට දක්වන ප්‍රේමයේ සෞම්‍ය ගැඹුරු ස්වභාවයත්

iii) ග්‍රීක පුරාණෝක්ති , බයිබල් සාහිත්‍යය ඇතුළු මා මෙහි යන්තමට පෙන්වූ තවත් මුලාශ්‍ර රාශියක් සමග දක්වන අපූරු inter-textual සම්බන්දතා නිසාත්

iv) පුෂ්කින්ගෙන් ආරම්භවී අනතුරුව ගොගොල් ගෙන් පන්නරය ලැබ සොලොගුබ් , බුල්ගාකොව් යනාදීන් අතින් පරිපාකයට පත්වන රුසියානු ඉන්ද්‍රජාලික /ෆැන්ටසි යථාර්තවාදී ධාරාවේ උරුමය ඓන්ද්‍රිය ලෙස උකහා ගැනීමේ බුහුටි බවත් නිසා මේ කෘතිය තව තව සාහිත්‍ය -දාර්ශණික සිතීම් වලට මාව පෙළඹෙව්වා

**හොරණ**

**ඉඩමක් හා නිවස විකිණීමට**

**හොරණ නගරයට ආසන්න**
**සියළු පහසුකම් සහිත**
**පර්චස් 20ක ඉඩමක් හා නිවස**
**විකිණීමට තිබේ.**
**විස්තර සඳහා අමතන්න 0411 421 227**